# බලංගොඩ අධ්‍යාපන කලාපය

## 7 ශ්‍රේණිය නර්තනය

**නිපුණතා මට්ටම** 6.2 වෙනත් සංස්කෘතිවලට අයත් නර්තන අංගවල සුවිශේෂ ලක්ෂණ ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම** කරගම් නැටුම්

ආදරණීය දුවේ පුතේ, අපි
අද ඉගෙන ගන්න යන්නේ
වෙනත් සංස්කෘතිවලට අයත්
නර්තන අංග මොනවද
කියලා. ඒ යටතේ අපි අද
ඉගෙන ගන්නේ කරගම්
නැටුම් පිළිබඳවයි



## කරගම් හැඳින්වීම

ඉන්දියාවේ ගැමි නැටුම් අතරින් සුවිශේෂ වූ ගැමි නැටුමකි. තමිල්ණාඩු ප්‍රාන්තය මූලික කරගෙන මෙහි ආරම්භය සිදු වූ අතර තාන්ජාවූර් ප්‍රදේශයේ ආගමික පුද පූජා අවස්ථාවන්හි දී දක්නට ලැබේ.

ලාංකේය වතුකර ද්‍රවිඩ ජනයා අතර ද පවතින සාම්ප්‍රදායික ජන නැටුම් විශේෂයක් ලෙස ද මෙම කරගම් නැටුම් දැක්විය හැක. කරහම්, කරණාට්ටම් යන නම් වලින් ද මෙකී සම්ප්‍රදාය හඳුන්වනු ලබයි.



## පුද ලබන දෙවිවරු

මාරි අම්මාන් දෙවියන්



ගංගා අම්මාන් දෙවියන්



කාලි දෙවියන්



මුරුගන් දෙවියන්



පත්තිනි  දෙවියන් (කන්නගී)



සිංහල ජනයා අතර වන්දනයට පාත්‍රවන පත්තිනි දේවිය ද්‍රවිඩ ජන සමාජයේ දී කන්නගී නමින් පුද පූජාවට පාත්‍ර වෙයි.

## උත්සවය පවත්වන කාල සීමාව

අගෝස්තු මාසය තුළ ඉන්දියාවේ හා ලංකාවේ පැවැත්වෙන උත්සවයකි.

## කරගම් නර්තනය පැවැත්වීමේ අරමුණු

- දේව භක්තිය ප්‍රකාශ කිරීම
- දේව ආශීර්වාදය ලබා ගැනීම
- නියඟය වළක්වා වර්ෂාව ලබා ගැනීම
- දෙවියන්ගේ ලෙඩ ලෙස සැලකෙන පැපොල, සරම්ප, වසූරිය ආදී ලෙඩ රෝග වළක්වා ගැනීම හා ඒවායින් ආරක්ෂා වීම



## කරගම් නැටුම් හා බැඳි සුවිශේෂ ලක්ෂණ

- සමබරතාවය තබා ගනිමින් නර්තනය කිරීම මෙහි විශේෂ ලක්ෂණයයි

- ඒ සඳහා කළයක් හිස මත තබාගෙන සරල චලන භාවිත කරයි. එය රතු, සුදු, කහ මල් වැඩි වශයෙන් අලංකාරය සඳහා යොදා ගැනේ

- තනි තනිව හා යුගල වශයෙන් නර්තනයේ යෙදෙති


- කළය මුදුනේ කඩදාසි වලින් සකස් කරන ලද **ගිරවකුගේ ආකෘතියක්** දැකිය හැක

- සමබරතාව පවත්වා ගැනීම සඳහා කළය තුළට සහල් දමනු ලැබේ. එහි කවාකාර බව ඉස්මතු කිරීමට බම්බු ලීයක් නළය තුලට සිරස් ව දමා එය වටා මල් වැල්වලින් අලංකාර කර නර්තනයේ චමත්කාරබව වැඩි කරයි

## රංග වස්ත්‍රාභරණ

දමිළ ලක්ෂණ පෙන්නුම් කරන සාරිය නොහොත් දිග සාය, හැට්ටය හා ආභරණ කාන්තාවන් භාවිත කරයි.

පිරිමි ධෝතිය හා පූන නූල භාවිත කිරීම දක්නට ලැබේ. රතු කහ කොළ වර්ණ වැඩි වශයෙන් යොදා ගනු ලබයි.








## සංගීතය හා වාද්‍ය භාණ්ඩ

බෙර වර්ග හා නළා වර්ග සංගීතය සඳහා යොදා ගනු ලබයි. **නෛයඩ් මේලම්** සංගීතය මෙහිදී සුවිශේෂ වේ. ඇතැම්විට ගායනය සඳහා ගීත ද යොදා ගැනේ.







## පසු ක්‍රියාකාරකම්

1. කරගම් නර්තන අංගයක් නරඹා එහි සමබරතාවය පවත්වා ගනිමින් නර්තනයේ යෙදෙන ආකාරය අධ්‍යනය කරන්න.

2. කරගම් නර්තන අංගයක් සඳහා පද 4ක් නිර්මාණය කරන්න.

සැකසුම

නර්තන ගුරු උපදේශිකා

සුමනා මාලිනී